# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No . | දිනය<br>திகதி<br>Date. 2023-10- 02 |

| | | |
|---|---|---|
| පැමිණිලි පාර්ශවය | : | එස්.ඒ.එම් නිලාම් මයා,<br>නො 127/2, ඕගොඩපොල,<br>කහටෝවිට. |
| වගඋත්තර පාර්ශවය | : | 01. මැනුම්පති,<br>ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව,<br>සර්වේයර් ජනරාල් කාර්යාලය,<br>අංක 150, බර්නාඩ් සොයිසා මාවත, (කිරුළ පාර)<br>නාරාහේන්පිට, කොළඹ. |
| | | 02. ලේකම්,<br>ඉඩම් අමාත්‍යාංශය,<br>'මිහිකත මැදුර' ඉඩම් මහලේකම් කාර්යාලය,<br>අංක 1200/6, රජමල්වත්ත පටුමග,<br>බත්තරමුල්ල. |
| | | 03. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,<br>විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,<br>මාලිගාවත්ත,<br>කොළඹ 10. |

<u>පැමිණිලි අංකය : HRC/4227/15</u>

ඉහත නම් සඳහන් පැමිණිලිකරු විසින් 2015.11.27 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තමා සැලසුම් ශිල්පියෙකු ලෙස 1978.12.01 වන දින මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සේවයට බැඳුනු බවත්, 2000.06.10 දින රා.ප.ච 30/88 (I) යටතේ විශ්‍රාමය සඳහා මනාපය පළකර සේවයෙන් ඉවත් වූ බවත්, 2007.05.08 දින නැවත සේවය ඉල්ලා ඉදිරිපත් කළ ලිපියට අනුව 2010.08.11 වන දින නැවත සේවය ලබාගත් බවත්ය.


| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04.<br>இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04.<br>No. 14, R.A.De Mel Mawatha, Colombo -04. | සභාපති<br>தவிசாளர்<br>Chairman | 011- 2505451 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011- 2505541/74 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94-11-2505580 / 81 /82 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011- 2505521 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 1996 |
| ඊමේල්<br>மின்னஞ்சல்<br>e-mail | sechrcsl@gmail.com | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk | | |

2000.06.10 දින විශ්‍රාම යාමට මනාපය පළකිරීමට ප්‍රථම තමාගේ අනිවාර්ය සේවා කාලය (වැටුප් රහිත නිවාඩු) වෙනුවෙන් වූ බැඳුම්කරයට අදාළ වූ මුදල වන රු. 65926.66 ක මුදල තමා විසින් ගෙවා නිමකරන ලද බවත්, මෙය රජයට සේවය කළ යුතු අනිවාර්ය සේවා කාලය සම්පූර්ණ කිරීමට නොහැකි වූ බැවින් ගෙවීමට සිදුවූ බවත් දක්වා ඇත.

දැනට තමා අනිවාර්ය සේවා කාලය ඉක්මවා සේවය කරඇති බැවින් එම මුදල ලබාගැනීමට සර්වේ ජනරාල්තුමා වෙත ඉල්ලීම් ඉදිරිපත් කළ විට අමාත්‍යාංශයේ උපදෙස් පරිදි, එය ගෙවීමට හැකියාවක් නොමැති බව දන්වන ලද නමුත් මෙයට හේතු දක්වා නොතිබූ බවත්, මේ පිළිබඳ අවුරුදු 4 ක පමණ සිට ඉල්ලීම් ඉදිරිපත් කරන ලද බවත්, තමා සේවයේ පිහිටුවීමට අවුරුදු 03 කට ආසන්න කාලයක් ගත කළ නමුදු තම සේවාවේ වෙනත් නිලධාරියෙකු වන කේ.එස්.එස්.ඩබ් ආරියවංශ මහතා ඉල්ලීම් ඉදිරිපත් කර මසක් වැනි සුළු කාලයක් තුළදී නැවත පත්වීම් ලබාදී ඇති බවත් නමුත් තමාට පමණක් අසමාන ලෙස කටයුතු කරන ලද බවත් දක්වා ඇත.

2011.07.04 දිනැතිව ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් මිනුම්පති අමතා යොමු කර ඇති ලිපියට අනුව නැවත සේවයේ පිහිටුවා ඇතත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව එසේ සිදුකර තිබීම යන හේතුව මත, නැවත සේවයේ පිහිටුවීමෙන් පසු 2010.08.11 දින සිට 2016.04.25 දින දක්වා කාලය විශ්‍රාම වැටුප් ගණනය කිරීමේදී අදාළ කරගත නොහැකි බව සඳහන් කර ඇති බව ප්‍රකාශ කර ඇත.

තවද පැමිණිලිකරු 2010.08.11 දින නැවත සේවයේ පිහිටුවා 2016.04.25 දින දක්වා සේවය කිරීම සම්බන්ධයෙන් ගෙවන ලද වැටුපද විශ්‍රාම වැටුපෙන් නැවත කොටස් වශයෙන් අයකර ගනිමින් සිටින බව ප්‍රකාශ කර ඇත.

මේ ආකාරයට තමාගේ සම්පූර්ණ සේවා කාලය විශ්‍රාම වැටුපට ගණනය නොකිරීම හා නැවත සේවයේ පිහිටුවීමෙන් පසු තමාට ගෙවන ලද වැටුප් නැවත අයකරගැනීම තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව කඩ කරමින් තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බව ප්‍රකාශ කර ඇත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

පැමිණිලිකරු ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සැලසුම් ශිල්පියෙකු ලෙස සේවයේ යෙදී සිටියදී විදේශගත වීමෙන් පසුව සම්පූර්ණ කළයුතු අනිවාර්ය සේවා කාලය සම්පූර්ණ නොකිරීම හේතුවෙන් බැඳුම්කරයකට අදාළව ගෙවිය යුතු මුදල (රු. 65926.66) ගෙවා ඇති බවයි. පැමිණිලිකරු රා.ප චක්‍රලේඛ 30/88 චක්‍රලේඛය අනුව විශ්‍රාම ගැනීමෙන් පසු නැවත සේවය ඉල්ලා සිටි බවත්, ඒ අනුව ඉඩම් හා ඉඩම්

සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2011.07.04 දිනැති ලිපිය අනුව නැවත සේවයේ පිහිටුවීම කර ඇති බවත්, ඒ අනුව ඔහු නැවත සේවයේ පිහිටුවා ඇති බවත් ප්‍රකාශ කර ඇත.

ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය නොලැබීම මත එකී පත්වීම විධිමත් නොවන බැවින් විශ්‍රාම වැටුප් ගණනය කිරීමේදී නැවත සේවයේ පිහිටුවීමෙන් පසුව කාලය විශ්‍රාම වැටුප් ගණනය කිරීමේදී අදාළ කරගැනීමට නොහැකි වී ඇති බව ප්‍රකාශ කර ඇත.

ඒ අනුව පැමිණිලිකරු විශ්‍රාම ගැන්වීමෙන් පසුව 2010.08.11 දින සිට 2016.04.25 දක්වා කාලයට අදාළව ගෙවන ලද සේවා වැටුප විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කරමින් සිටින බව ප්‍රකාශ කර ඇත.

**නිරීක්ෂණ :-**

මෙම පැමිණිල්ලට අදාළව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පරීක්ෂණයක් සිදුකරන ලද අතර, එහිදී දෙපාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති කරුණු අනුව පහත පරිදි නිරීක්ෂණය වී ඇත.

01. පැමිණිලිකරු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/88 මගින් 2001.02.23 දින විශ්‍රාම ගන්වා ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2010.07.04 වන දිනැති ලිපිය අනුව නැවත සේවයේ පිහිටුවීම අනුමත කර ඇත. ඒ ආකාරයටම පැමිණිලිකරු සේවය කරන ආයතනයේ සේවය කළ සිතියම් තාක්ෂණ ශිල්පී කේ.එල්.එස්.එන් ආරියවංශ මහතාද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/88 අනුව, 2009.09.01 දින විශ්‍රාම ගන්වා 2010.07.26 වන දින නැවත සේවයේ පිහිටුවා ඇත. ඔහු දෙවන වර නැවත සේවයේ පිහිටුවීමෙන් පසුව වයස අවු.60 සම්පූර්ණ වීම මත නැවත විශ්‍රාම ගන්වා එකී නැවත සේවය කරන ලද කාලයට අදාළ වන පරිදි විශ්‍රාම වැටුප් ගණනය කර, දැනට විශ්‍රාම වැටුප් ලබමින් සිටින බව පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වාර්තා කර ඇත. නමුත්, පැමිණිලිකරුට ඊට සමාන ආකාරයෙන් කටයුතු කර නොමැති බවද සඳහන් කර ඇත.

02. තවද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ 2018.11.26 දින සහ අංක DD/81/2007 අංක දරණ ලිපියෙහි (VI) සඳහන් පරිදි, කිසිදු විශ්‍රාමලත් රාජ්‍ය නිලධාරියෙකුට නැවත සේවය ලබාගැනීමේ අයිතිවාසිකමක් නොමැති බවට කරුණු දක්වා ඇති නමුත්, පැමිණිලිකරුට සමගාමී සැලසුම් ශිල්පී කේ.එල්.එස්.එන් ආරියවංශ මහතා 30/88 (1) යටතේ නැවත සේවයේ පිහිටුවා ඇති බව හා නැවත සේවය කළ කාලයට විශ්‍රාම වැටුප්ද ගණනය කර ඇති බවද අනාවරණය වේ.

03. පැමිණිලිකරු තවදුරටත් 2010 සිට 2016 දක්වා අවුරුදු 60 සම්පූර්ණ වන තෙක් සේවයේ යොදවා ඇත. පැමිණිලිකාර එස්.ඒ.එම් නිලාම් යන අයගේ සේවය අභිනියෝජිත බලය උල්ලංඝනය කර ඇති බව හඳුනාගත් අවස්ථාවේදීම අවසන් කළේ නම් මෙවැනි තත්වයක් උදා නොවන බවද නිරීක්ෂණය වේ.

04. ඒ අනුව, පැමිණිලිකරු තවදුරටත් සේවයේ යොදවා ඔහුගේ සේවය ලබාගෙන පසුව ඔහු සේවය කරන ලද කාලයට අදාළ වැටුප නැවත විශ්‍රාම වැටුපෙන්අයකරගෙන තිබීම හා අදාළ සේවා කාලය විශ්‍රාම වැටුපට ගණනය නොකිරීම තුළින් ඔහු අසාධාරණයට ලක්ව ඇති බව නිරීක්ෂණය වේ. පැමිණිලිකරු හා ඉහත නම් සඳහන් ආරියවංශ නැමැති නිලධාරියා සම තත්වයේ නිලධාරීන් වන අතර, ඔවුන් දෙදෙනාට දෙආකාරයකින් සැළකිම මත වෙනස්කොට සැළකීමක් ලෙස නිරීක්ෂණය වේ.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පැමිණිලිකරු නැවත සේවයේ පිහිටුවා සේවයේ යොදවා වැටුප් ගෙවා ඇති බැවින් ගැටළුව නිරාකරණය කිරීමට ඔහුගේ පත්වීම විධිමත් කරන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කළද, අභිනියෝජිත බලය අභිබවා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව මෙම නැවත සේවයේ පිහිටුවීම සිදුකර ඇති බැවින් ඒ පිළිබඳ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට කටයුතු කළ නොහැකි බවත්, බලාතික්‍රමණය කළ බලධාරීන් විසින්ම පසුව මතුවී ඇති සියළු තත්වයන් පිළිබඳ වගකීම බාරගත යුතු බවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ 2013.09.20 දිනැතිව ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් අමතන ලද ලිපියේ සඳහන් කර ඇත. එහිදීද වගකීම පවරා ඇත්තේ, පැමිණිලිකරු වෙත නොව අදාළ නිලධාරීන් වෙතය. එසේම කාර්ය පටිපාටි නීති අනුව විශ්‍රාම ලැබූ නිලධරයෙකු සේවයේ පිහිටුවීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කළ යුතු අතර, එය නිසි පරිදි ලබා නොගෙන අමාත්‍යාංශය ලේකම්වරයා අදාළ පත්වීම සිදුකර ඇත. මේ නිසා මෙය රාජ්‍ය සේවා කොමිසම හා අමාත්‍යාංශ නිලධාරීන් අතර අභිනියෝජන බලතල පිළිබඳ ගැටළුවක් වන අතර, ඒ සඳහා පැමිණිලිකරු අගතියට පත් කිරීම සුදුසු නොවන බවද පෙනී යයි.

මේ පිළිබඳ පැමිණිලි පාර්ශවය විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට කරන ලද අභියාචනය ඉහත කරුණු මත ප්‍රතික්ෂේප වී ඇත.

මේ පිළිබඳ පරිපාලන අභියාචනා විනිශ්චයාධිකාරිය වෙත පැමිණිලිකරු විසින් යොමු කරන ලද AAT/92/2018 දරණ අභියාචනයද ඉහත හේතුව මත නිශ්ප්‍රභා කර ඇත.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පැමිණිලිකරු නැවත සේවයේ යොදවා කටයුතු කිරීම සම්බන්ධයෙන් කිසිදු නෛතික ක්‍රියාමාර්ගයක් ගෙන ඇති බවට කරුණු නිරීක්ෂණය නොවේ.

එමෙන්ම පැමිණිලිකරු නැවත සේවයේ පිහිටුවීම, පැමිණිලිකරුගේ පාලනයෙන් තොර ක්‍රියාවක් වන අතර, නැවත සේවයේ පිහිටුවීමෙන් පසු ඔහු විසින් ආයතනයට ලබා දෙන ලද සේවයට අදාළව ගෙවන ලද වැටුප නැවත අයකරගැනීමට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයාට නෛතික ප්‍රතිපාදන ඇති බවට කරුණු නිරීක්ෂණය වී නොමැත. නිලධාරියෙකුගේ වැරදි සහගත ක්‍රියාවකින් හෝ ව්‍යාජ සහතික ඉදිරිපත් කිරීම

වැනි අවස්ථා හැර ලබා දී ඇති පත්වීමක සේවය කළ පසු එම වැටුප් අයකර ගැනීමේ නෛතික ප්‍රතිපාදන නොමැති බව කොමිෂන් සභාවේ අවධානයට ලක්විය.

පත්වීම විධිමත් නොවීම මත එකී අදාළ සේවා කාලය විශ්‍රාම වැටුපට ගණනය නොකලද පැමිණිලිකරු කරන ලද සේවය වෙනුවෙන් ගෙවන ලද වැටුප් නැවත අයකරගැනීම තුළින් වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුගේ 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වන ව්‍යවස්ථාව මඟින් සහතික කොට දී ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට නිරීක්ෂණය වේ. එකී සේවා කාලය සඳහා විශ්‍රාම වැටුප නොගෙවා සිටීමට හැකියාව පැවතුනද (සේවයක නිරතව වැටුප් ලබන නිසා) සේවය සඳහා ගෙවන ලද වැටුප අයකර ගැනීමට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයාට ප්‍රතිපාදන නොමැති අතර, යම් සේවකයෙකුගෙන් රජයට සිදුවී ඇති අලාභයක්, පාඩුවක්, හානියක් වේ නම් ඒ සම්බන්ධව විධිමත් පරීක්ෂණයකින් පසු ඒ සඳහා වගකීමට බැඳී සිටින තැනැත්තාගෙන් එම මුදල අයකර ගැනීමේ හැකියාව පමණක් පවතී. අත්තනෝමතික ලෙස ක්‍රියා කිරීමේ හැකියාවක් කිසිදු රාජ්‍ය නිලධාරියෙකුට ලැබී නොමැත.

මෙම සිදුවීමේදී පැමිණිලිකරුගේ පාලනයෙන් තොරව කර ඇති විධායක ක්‍රියාවක් මත ඔහු වෙත වගකීම පැවරීමේ හැකියාවක් නොපෙනේ.

මේ සම්බන්ධව බලධරයා වන රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්වරයා විමසා ගැටළුව නිරාකරණය කර ගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ හැකිව පැවැති බවද කොමිෂන් සභාවේ නිගමනය වේ.

තවද මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙහි 23(3) වගන්තිය යටතේ ‘වැඩකරන සෑම කෙනෙකුටම සාධාරණ සහ හිතකර වේතනයක් ලබාගැනීමේ අයිතිය’ සහ ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 7(a) (i) වගන්තියට අනුව ‘සමාන වටිනාකමක් ඇති වැඩ සඳහා සාධාරණ වැටුප් සහ, සමාන වේතනයක් ලබාගැනීමේ අයිතිය ඇති බැවින් හා එකී ප්‍රඥප්තීන් ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති බැවින් ඒ අනුව කටයුතු කිරීමට රජයක් ලෙස බැඳී සිටී.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශ කර සිටී.**

> පැමිණිලිකරු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/88 අනුව විශ්‍රාම ගැන්වීමෙන් පසුව අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නැවත සේවයේ යොදවා සේවය කර ඇති කාල සීමාවට අදාළව ගෙවන ලද වැටුප නැවත විශ්‍රාම වැටුපෙන් අයකරගැනීම අත්හිටුවිය යුතුය. එසේම මෙතෙක් අයකරගෙන ඇති මුදලද පැමිණිලිකරු වෙත නැවත ලබාදීමට අවශ්‍ය පියවර ගත යුතුය.

2023.10.31 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Justice L.T.B.Dehideniya
Judge of the Supreme Court (Retired)
Chairman
Human Rights Commission of Sri Lanka

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් පී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :- 01. හරින් ප්‍රනාන්දු මයා,
අමාත්‍යතුමා,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර' ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

02. කේ.ඩී.එන් රංජිත් අසෝක මයා,
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

B/